# මඩකලපුව මහ නගර සභාව

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 10 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, නගරාධිපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1990 වර්ෂයේදී අස්ථානගතවූ රු.6,860,650 ක් වටිනා ජල බවුසරය පොත්වලින් ලියා හැරීමට අවශ්‍ය කටයුතු නොකර, ගිණුම් ප්‍රකාශවල දිගටම වත්කමක් ලෙස පෙන්වා තිබුණි.

(ආ) මහ නගර සභාව සතු පුස්තකාලයේ 2013 දෙසැම්බර් 31 දිනට වූ පුස්තකාල පොත් 29,000 ක වටිනාකම ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) 2004 වර්ෂයේදී රාජ්‍ය නොවන සංවිධානයකින් පරිත්‍යාගයක් වශයෙන් ලැබුණු ව්‍යායාම උපකරණ වල වටිනාකම ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.150,000 ක්වූ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නෙතිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු රු.558,185 ක මුදල ගෙවා නිම කිරීමට කටයුතු නොකර 2009 වර්ෂයේ සිට තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ආ) විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවී ගිය සේවකයින් 30 දෙනෙකුගෙන් අයවිය යුතු රු.775,658 ක හිඟ සේවක ණය ශේෂය, විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශ වල දිගටම පෙන්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 111,766,669 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 16,642,382 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 85,734,437 | |
| ලීබඩු | 9,389,850 | |
| පොදු ගබඩා භාණ්ඩ | 46,149,231 | |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.20,723,801 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.6,236,621 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,487,180 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් කළමනාකරණය

------------------------------

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් වර්ගය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් සහ බදු | 29,543,207 | 4,103,442 | 25,439,765 |
| බදු කුලී | 3,318,452 | 3,652,764 | (334,312) |
| වෙනත් බදු | 10,765,393 | 15,576,474 | (4,811,081) |

2.2.2 වරිපනම්

-----------

1990 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු හිඟ වරිපනම් රු.13,517,544 ක් විය.

2.2.3 බදු

-----

1990 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවිය යුතු හිඟ බදු රු.2,296,174 ක් විය.

2.2.4 වෙනත් ආදායම්

------------------

අයවිය යුතු විනෝද බදු, බදු කුලිය, දැන්වීම් පුවරු ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේ රු.9,073,640 ක මුදලක් හිඟව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් 1995 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් දායක මුදල් මාසිකව ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු නොකිරීමේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතුව තිබූ දායක මුදල් ප්‍රමාණය රු.26,943,315 කි.

(ආ) වාහන 9 ක ධාවන මනු වසර 5 කට වඩා වැඩි කාලයක් ක්‍රියා විරහිත තත්ත්වයේ තිබුණද, මේවා අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය වත්කම්
-------------------
සභාව සතු ලොරි 02, ට්‍රැක්ටර් රථ 05 සහ බවුසර් රථ 03 අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වසර පහකට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------
2009 වර්ෂයේදී නෙක්ටප් ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 10 ක පිරිවැයකින් තිරුප්පෙරුන්තුරෙයි හි ඉදිකරන ලද ඝන අපද්‍රව්‍ය බැහැර කරන මධ්‍යස්ථානයේ ඝන අපද්‍රව්‍ය පිළිවෙලකට ශ්‍රේණිගත කර කළමනාකරණය කිරීමට අපොහොසත් වී තිබුණ අතර පසුව මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි. මෙසේ මෙම ව්‍යාපෘතිය අත්හැර දැමීම නිසා එම ප්‍රදේශයේ මහජනතාවට අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය
----------------------------------------
4.1 අයවැය පාලනය
------------------
අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 10 % සිට 60 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් රැස් කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) ස්ථාවර වත්කම් නඩත්තු